# පෞරාණික දේශයේ ක්‍රියාත්මක වූ සිවිල් අයිතිවාසිකම් පිළිවෙත කෙරෙහි බෞද්ධාගාමික බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

දර්ශන මනෝජ් බණ්ඩාර[1]

දිවයිනේ ප්‍රමුඛ උපරාජ්‍ය වන රෝහණ දේශයේ පාලන රටාව, රජරට ශිෂ්ටාචාරයේ පැවති දේශපාලන රටාවේ එක් පැතිකඩක් නිරූපණය කරයි. දීර්ඝ කාලයක් දිවයිනේ ජනතාව වෙත රාජ්‍ය පාලකයින් විසින් පවත්වා ගෙන යන ලද පාලන රටාවෙන් ලබා දුන් නිදහස්කාමී හා අයිතිවාසිකම් පද්ධතියක් පැරණි යුගය පිළිබඳ මූලාශ්‍රය ගැඹුරින් විශ්ලේෂණය කිරිමෙහිදී හඳුනා ගැනීමට හැකි වේ. ජීවත් වීම හා බැඳුණු නිදහස්ව භුක්ති විදිය හැකි අයිතිවාසිකම් පද්ධතියක් රෝහණයේ ජනතාවට ද හිමි ව තිබූ බව මූලාශ්‍රය අධ්‍යයනයේදී පැහැදිලි විය. නූතන මානව අයිතිවාසිකම් වර්ගීකරණයේ සිවිල් අයිතිවාසිකම් ලෙස සැලකෙන දිවි පැවැත්ම තහවුරු කර ගැනීමට ඇති ජීවත්වීමේ අයිතිය, අත්තෝමතිකව සිරභාරයට ගැනීමෙන් වැලැකීමේ අයිතිය, කෲර අමානුෂික වද හිංසාවලින් මිදීමට ඇති අයිතිය, සාධාරණ නඩුකරයකට හා නිර්දෝෂිභාවයේ පූර්ව නිගමනය වැනි අයිතිවාසිකම් පද්ධතියක්ම පෞරාණික රෝහණයේ ක්‍රියාත්මක වී ඇත. මෙම අයිතිවාසිකම් එකල රජවරු ජනතාවට ලබා දී ඇත්තේ ධම්ම, පුබ්බචරිය, රාජාඥ යන නීති මූල මත පදනම් වෙමිනි. බොහෝ නෛතික ආඥාවෙන් ශිලා මූලාශ්‍රයවල දැක්වේ. රජවරුන්ගේ නීති කෙරෙහි බලපෑ මූලයන් රටේ ප්‍රධාන ආගම වූ බෞද්ධාගම මත පදනම්ව සකස්ව ඇති බව නිරීක්ෂණය කළ හැකි වේ. ජීවත්වීමට පැවති නිදහස කඩ කරන ජනතාවට මරණ දඬුවම පවා පනවා ඇත. නමුත් සිරිසඟබෝ උපතිස්ස වැනි රජවරු මෙම දඬුවම ක්‍රියාත්මක කිරීම ප්‍රාණඝාතයක් සේ සලකා උපක්‍රමශීලීවම මගහැර ඇත. මෙරට රජවරු බෞද්ධ ඉගැන්වීම් අනුව සතුන්ගේ පවා ජීවත් වීමේ අයිතිය සුරැකි බවට තොරතුරු හමු වේ. රෝහණ දේශයේ ද කෲර අමානුෂික වද හිංසා තහනම් කළ බවට තොරතුරු කොණ්ඩ වට්ටුවාන්, බදුල්ල වැනි සෙල්ලිපිවලින් තහවුරු වේ. තමන්ට උපමා කර අන්‍යයන්ට හිංසා පීඩා නොකළ යුතු බවට වන බෞද්ධ ඉගැන්වීම මෙහිදී සිහිපත් වේ. රාජ්‍යත්වයේ පැවැත්ම පිළිබඳව බෞද්ගාමික ඉගැන්වීම්වල එන බොහෝ ඉගැන්වීම් නීති පද්ධතිය සකස් කිරීමට බලපා ඇති බව මූලාශ්‍රය මගින් තහවුරු වේ. පෞරාණික රෝහණ රාජ්‍යයේ පැවති නීති පද්ධතියේ දැකිය හැකි මානව අයිතිවාසිකම් පිළිවෙත ද බෞද්ධාගමික පදනමක් මත සකස්ව ඇති බව පැහැදිලිව හඳුනා ගත හැකි විය.

**ප්‍රමුඛ පද :** රෝහණ රාජ්‍ය, මානව අයිතිවාසිකම්, සිවිල් අයිතිවාසිකම්, බෞද්ධාගමික බලපෑම, ජීවත්වීමේ අයිතිය

1 කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය